සැලසිනේ මීඩියා සොලූෂන්ස් පුද්ගලික සමාගම - 2023

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සැලසිනේ මීඩියා සොලූෂන්ස් පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 03ක කාලපරිච්ඡේදය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 03 ක කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 03 ක කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සමාගම විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගැනිම සඳහා ගිණුම් කේතයන් සහිතව වර්ගීකරණය කරන ලද ගිණුම් වල ලැයිස්තුවක් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර ඒ ඒ ගිණුම හඳුනා ගැනීම සඳහා ගිණුම් කේතයන් (Accounts Code) පද්ධතියට හඳුන්වා දී නොතිබුණි.	පිළිතුර අදාළ නොවේ.	ගිණුම් කේතයන් සහිතව වර්ගීකරණය කරන ලද ගිණුම් වල ලැයිස්තුවක් යාවත්කාලීනව පවත්වා ගතයුතු අතර ගිණුම් කේතයන් පද්ධතියට හඳුන්වා දිය යුතුය.

1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 07 ඡේදය අනුව මුදල් සහ මුදල් සමාන දෑ යටතේ හඳුනාගත යුතු මාස 01 ත් මාස 03 ත් අතර කල් පිරීමේ කාලයකින් යුතු රු.15,052,990ක වටිනාකමක් සහිත ස්ථාවර තැන්පතු ශේෂ 04 ක් ආයෝජන තුළ ඇතුළත් කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන 2023 දෙසැම්බර් 31 දිනට ආයෝජන ශේෂය රු.15,052,990 කින් අධිතක්සේරු වී තිබුණු අතර මුදල් සහ මුදල් සමාන දෑ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	මෙම ත්‍රෛමාසික තැන්පතු වර්තමාන පොලී අනුපාතිකයද සැලකිල්ලට ගෙන මාස 06 තැන්පතු ලෙස පරිවර්තනය කර ආයෝජන යටතේ පවත්වා ගැනීමට උපදෙස් ලබාදුනි.	ආයෝජන හා මුදල් හා මුදල් සමාන දෑ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

(ආ) 2014 වර්ෂයේ දි සිදු වි ඇති සේවක මූල්‍ය වංචාව සම්බන්ධ රු.11,988,000 ක ශේෂය නිවැරදි කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදය අනුව ඒ ඒ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය නැවත ප්‍රකාශනය කර නොතිබුණි.	ඒ ඒ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය නැවත ප්‍රකාශනය කිරීමට කටයුතු යොදා ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 42 ඡේදය ප්‍රකාරව පූර්ව වැරදි නිවැරදි කිරිමේ දී එම වැරදි වලට අදාළ වන වත්කම් ,වගකීම් හා රඳවාගත් ඉපයුම් ශේෂයන් සමාලෝචිත වර්ෂයේ දී නැවත ප්‍රකාශනය කළ යුතු වුවද 2023 සැප්තැම්බර් 30 දිනට සැලසිනේ සමාගම විසින් 2022 වර්ෂය තුළ දී සිදු වු වැරදි නිවැරදි කර තිබුණද නිවැරදි කරන ලද රු.21,153,195 ක අගයකින් යුතු වත්කම් ,වගකීම් හා රඳවාගත් ඉපයුම් ශේෂයන් නැවත ප්‍රකාශනය කර 2022 ජනවාරි 01 දිනට , 2022 දෙසැම්බර් 31 දිනට හා 2023 සැප්තැම්බර් 30 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය ඇතුළත් විස්තරාත්මක සටහනක් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර නොතිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 42 වගන්තිය ප්‍රකාරව නැවත ප්‍රකාශනය කිරීමටත්, ඊට අදාළව විස්තරාත්මක සටහනක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමටත් කටයුතු දැනටමත් යොදා ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කළ යුතුය.
(ඈ) (i) 2021 අංක 18 දරන මුදල් පනත ප්‍රකාරව 2022 වර්ෂයේ දී කපාහැර තිබු රු.24,784,856 ක ජාතිය ගොඩනැගීමේ බදු උපචිත ශේෂය හා රු.347,265 ජාතිය ගොඩනැගීමේ බදු ලැබිය යුතු ශේෂයන්හි ශුද්ධ වටිනාකම රු. 24,437,590 ක් 2022 වර්ෂයේ දි රඳවාගත් ඉපයුම්වලට ගලපා තිබුණද ඉහත ප්‍රමිතයේ විධිවිධාන ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වු මූල්‍ය ප්‍රකාශන වල ඒ පිළිබඳව සටහනකින් හෙළිදරව් කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශනවලද සටහනකින් හෙළිදරව් කිරීමට කටයුතු කර 2024 ගිණුම් සමඟ ඉදිරිපත් කරමි.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව රඳවාගත් ඉපයුම් වලට ගැලපීම් කිරීමේදී මූල්‍ය ප්‍රකාශන වල ඒ පිළිබඳව සටහනකින් හෙළිදරව් කළ යුතුය.
(ii) 2021 වර්ෂයට අදාළ එකතු වටිනාකම රු. 4,396,999 ක ඍජු වියදම් 2021 වර්ෂය තුළ දි අත්තිකාරම් ලෙස හඳුනාගෙන තිබුණු අතර 2022 වර්ෂය තුළ දී රඳවාගත් ඉපයුම් වලට ගලපා නිවැරදි කර තිබුණද 2021 ජනවාරි 01 දිනට ,2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හා 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම්,වගකීම් හා රඳවාගත් ඉපයුම් ශේෂයන් නැවත ප්‍රකාශනය කර නොතිබුණි. ප්‍රමිතයේ විධිවිධාන ප්‍රකාරව පූර්ව වර්ෂයේ සිදු වි ඇති වැරදිවල ස්වභාවය සහ නිවැරදි කරන ලද වටිනාකම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මගින් විස්තරාත්මකව හෙළිදරව් කර නොතිබුණි. එම වටිනාකම් වල එකතුවක් පමණක් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදයට අදාල ආරම්භක ශේෂ වල වෙනස්කම් වලට හේතු විස්තරාත්මකව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.	අදාළ සටහන් ප්‍රමිතිය ප්‍රකාරව නැවත ප්‍රකාශනය කිරීමටත්, පූර්ව වර්ෂයේ සිදුවී ඇති වැරදි නිවැරදි කිරීම් සටහනකින් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමටත් කටයුතු කරමි. එම නිවැරදි කිරීම් සමඟ 2024 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරමි.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව නිවැරදි කරන ලද පූර්ව වර්ෂයේ සිදු වී ඇති වැරදි වල ස්වභාවය හා නිවැරදි කරන ලද වටිනාකම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මඟින් හෙළිදරව් කළ යුතුය.

(ඉ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09හි 5.5.13 සිට 5.5.16 දක්වා ඡේදවල විධිවිධාන වලට අනුව මූල්‍ය වත්කමක ණය අවදානම මූලික හඳුනාගැනීමේ සිට සැලකියයුතු අන්දමින් වැඩි වී ඇත්නම් අපේක්ෂිත ණය අලාභ (Expected Credit Loss) ප්‍රවේශය අනුව හානිකරණ අලාභ සඳහා ගැලපිය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.306,916,350 ක් වූ මුළු ණයගැති වටිනාකමින් සියයට 62ක් එනම් රු.189,717,470 ක් වූ වර්ෂ 05 ඉක්මවූ අවදානම් සහිත ණය ගැති ශේෂ ඇතුළුව දින 90 ඉක්මවූ සියලු ණයගැතියන් සඳහා සියයට 5ක් වන සේ අඩමාන ණය සඳහා වෙන්කිරීම් සිදුකිරීම සමාගමේ ප්‍රතිපත්තිය ලෙස සලකා කටයුතු කර තිබුණි.	සමාගමේ අඩමාණ ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය තවදුරටත් සාකච්ඡාවට භාජනය කොට මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියද පරිදි කටයුතු කිරීමට අවශ්‍ය විධිවිධාන සලස්වමි.	ශ්‍රීලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට අනුකූලව හානිකරණ අලාභ සඳහා ගැලපීම් සිදු කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 77 හා 81 (ඉ) ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන තුළ විලම්භිත බදු වත්කම හා බදු ආදායම හඳුනාගත යුතු වුවත් 2023 ඔක්තෝබර් 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා මාස 03 ක කාලපරිච්ඡේදය තුළ රු. 1,620,393 ක විලම්භිත බදු වත්කම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණු අතර එම වටිනාකමින් ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.	මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එම වටිනාකම් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. දේපළ පිරියත හා උපකරණ වටිනාකම් මත ප්‍රාග්ධන දීමනාව මාස 03 ක කාලපරිච්ඡේදයට හඳුනාගැනීමට කටයුතු කරමි.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව විලම්භිත බදු වත්කම හඳුනාගත යුතුය.
(උ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 79 හා 80 ඡේදය අනුව ආදායම් බදු වියදම තුළ ඇතුලත් වියදම් සංරචක මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත් 2023 ඔක්තෝබර් 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා මාස 03 ක කාලපරිච්ඡේදය සඳහා සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 79 හා 80 වගන්ති අනුව කටයුතු කිරීමට උපදෙස් ලබාදුනි.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව ආදායම් බදු වියදම තුළ ඇතුළත් වියදම් සංරචක මූල්‍ය ප්‍රකශන වල වෙන වෙනම හෙළිදරව් කළ යුතුය.
(ඌ)	සමාගම විසින් සිය පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා කල්බදු ක්‍රමය යටතේ අත්පත් කරගෙන තිබුණු ගොඩනැඟිල්ලට අදාළව රු.21,000,000 ක මූලික ගෙවීමක් සිදු කර තිබුණු අතර එම වටිනාකම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 ට අනුව භාවිත අයිතිය සහිත වත්කමෙහි (Right to use Asset)කොටසක් ලෙස හඳුනාගැනීම වෙනුවට අත්තිකාරම් ගෙවීම් ගිණුමකට සටහන් කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි ජංගම වත්කම් අධිතක්සේරු වී තිබුණි.	ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 අනුව ගිණුම් තැබීම හා මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කොට අදාළ හෙළිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු කරමි.	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට අනුකූලව කල් බදු ක්‍රමය යටතේ අත්පත් කරගෙන තිබුණු ගොඩනැගිල්ල භාවිත අයිතිය සහිත වත්කමෙහි කොටසක් ලෙස හඳුනාගත යුතුය.

(එ) ඉහත ප්‍රමිතයේ විධිවිධාන ප්‍රකාරව මෙම ගොඩනැගිල්ල සඳහා මාසික කල්බදු වාරික තුළ ඇතුළත් පොලී වියදම ලෙස රු. 1,268,932 ක් ආදායම් ප්‍රකාශනයට හඳුනාගත යුතු වුවද සමාගම විසින් සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා මුළු කල්බදු වාරිකය ගොඩනැගිලි කුලී වියදම් ලෙස රු. 2,175,000 ක් ආදායම් ප්‍රකාශනයට හඳුනාගැනීම හේතුවෙන් වර්ෂයේ අලාභය රු. 906,068 කින් අධිතක්සේරු වී තිබුණි.	මෙම වරද නිවැරදි කොට මූල්‍ය වාර්තා ඉදිරිපත් කරමි.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මාසික කල් බදු වාරික තුළ ඇතුළත් පොලී වියදම ආදායම් ප්‍රකාශනයට හඳුනා ගත යුතුය.

1.5.3. ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා විගණන ගණනය කිරීම් වලට අනුව මුදලින් ලද පොලී ආදායම රු.629,005 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.757,889 ක වටිනාකමක් දක්වා තිබුණු අතර ඒ හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදලින් ලද පොලී ආදායම රු.128,884 කින් වැඩියෙන් දක්වා තිබුණි.	විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණුවලින් වන බලපෑමද සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය නැවත සකස් කොට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	මුදල් හා මුදල් සමාන දෑ හා ආයෝජන නිවැරදිව හඳුනාගෙන මුදල් ප්‍රවාහය ප්‍රකාශනය නිවැරදිව පිළියෙළකළ යුතුයි.
(ආ)2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන්හි වෙළඳ ණයගැති ශේෂය තුළ ඇතුළත් ශේෂයන් අදාළ ණයගැති ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සමඟ සැසඳීමේදී එක් ආයතනයක ශේෂය රු.3,016,081ක් වැඩියෙන් හා ආයතන 03ක එකතු වටිනාකම රු.1,815,879ක් අඩුවෙන් දක්වා තිබුණි. නිවැරදි වටිනාකම හඳුනාගෙන නිරවුල් කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.	අප ආයතනයේ ණයගැති ශේෂය නිවැරදි වේ. මේ සම්බන්ධයෙන් වැඩිදුර තහවුරු කර ගැනීමෙන් පසු වාර්තා කිරීමට කටයුතු කරමි.	ණයගැති ශේෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ) සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ රඳවාගත් ඉපයුම් වලට ගලපා තිබුණු මුදල් ප්‍රවාහයක් ජනනය නොවන රු.1,769,686 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වන මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි.	විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණුවලින් වන බලපෑමද සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය නැවත සකස් කොට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	මුදල් ප්‍රවාහය ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කල යුතුය.
(ඈ)2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 3(1) වගන්තියට අනුව යම් පුද්ගලයෙකු විසින් ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු එම පුද්ගලයා විසින් අදාළ තක්සේරු වර්ෂයේ අදාල කාර්තුව සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් හිලව් කල හැකි වේ.එසේ වුවද සමාගම ආරම්භ කරන ලද 1982 වර්ෂයේ සිටම ආදායම් බදු ගෙවා නොතිබුණු පසුබිමක වර්ෂ 11 කට ආසන්න කාලයක සිට ලැබීමට හිමිකමක් නොමැති රු. 3,599,749 ක ශේෂයක් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වෙළඳ හා වෙනත් ලැබියයුතු දෑ යටතේ දක්වා තිබීම නිසා එම වටිනාකමින් ජංගම වත්කම් වැඩියෙන් දැක්වුණි.	සැලසීනේ රූපවාහිනී ආයතනය විසින් ගෙවිය යුතු ආදායම් බදු බැඳියාව වෙනුවෙන් කලින් ගෙවන ලද අත්තිකාරම් බදු ගෙවීමක් ලෙස ආර්ථික සේවා ගාස්තුවක් වූ රු. 3,599,749 ක ශේෂ පිළිබඳ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේද එම අගය අප නමින් පවතින බව තහවුරු කරගන්නා ලදි.	ලැබියයුතු වටිනාකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි.

1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම	අනුරූපී වාර්තා අනුව වටිනාකම	වෙනස	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ආයතන 04කට අදාල වෙළඳ හා ගෙවියයුතු ශේෂය	රු. 80,172,379	රු. 79,387,263 (අදාල ආයතනයන්හි ශේෂ සනාථන අනුව)	රු. 785,116	අප ආයතනයේ ණයහිමි ශේෂය නිවැරදි බවත් එය තහවුරු කිරීමෙන් පසු වාර්තා කරමි.	ණයහිමි ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය .

1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විෂය	මුදල	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)ණයගැතියෝ	306,726,600	ශේෂ සනාථනයන්	සියලුම ණයගැතියන් වෙත ඊ මේල් තාක්ෂණය ඔස්සේ ශේෂ සනාථන යැවීමට කටයුතු කරමි.	විගණනය වෙත සෘජුව ලැබෙනසේ ශේෂ සනාථන කැඳවීමට කටයුතු කළ යුතුයි.
(ආ)සෘජු වියදම්	38,967,586	සෘජු වියදම් ශේෂයන් සඳහා විස්තරාත්මක උපලේඛන	රු. 3,967,586 ක් වූ සෘජු වියදම් තුළ ඇතුළත් වූ වියදම් සඳහා නැවතත් උප ලේඛන මේ සමඟ අමුණා එවමි.	මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන විගණකාධිපති මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර විගණනයට ඉදිරිපත්කළ යුතුය.
(ඇ)රඳවාගත් ඉපයුම් වලට සිදුකළ ගැලපීම් ගොඩනැගිලි කුලී ගැලපුම් සෘජු වියදම්	4,804,831 3,035,145	2023 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළ රඳවාගත් ඉපයුම් වලට ගලපා තිබුණු ගොඩනැගිලි කුලී ගැලපුම් රු.4,804,831 ක් සහ රු.3,035,145 ක සෘජු වියදම් ගැලපීම් වලට අදාලව ජර්නල් වවුචර්.	පිළිතුරු ඉදිරිපත්කර නොමැත.	රඳවාගත් ඉපයුම් වලට සිදුකරනු ලබන ගැලපුම් සඳහා ජර්නල් වවුචර විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ඝමාලෝචිත කාලපරිච්ඡේදයේ අවසන් දිනට වෙළඳ ණයගැති ශේෂය රු.306,916,350 ක් වූ අතර ඉන් රු.182,732,477ක් වර්ෂ 05 ඉක්මවූ ණයගැති ශේෂයන්ගෙන් ද රු.42,012,529 ක් වසර 1-5 අතර ණයගැති ශේෂයන්ගෙන් ද සමන්විත වුවද අදාල ශේෂයන් අයකරගැනීමට සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ද කටයුතු කර නොතිබුණි.	ණය අයකර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර වර්ෂ ගණනාවක සිට පැවත එන ණයගැති ශේෂ අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග පිළිවෙතක් ආරම්භ කොට ඇත.	ලැබියයුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ වෙළඳ ණයහිමි ශේෂය රු.243,118,160 ක් වූ අතර ඉන් වර්ෂ 5 ඉක්මවූ ශේෂය රු.52,922,069 ක් ද වසර 1-5 ත් අතර වෙළඳ ණයහිමි ශේෂය රු. 49,139,360 ක් ද විය. අදාළ ණය හිමි ශේෂය තුළ වසර 04 සහ 05 ට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු. 1,436,550 ක සෘණ එකතු වටිනාකමක් ද සහිත ණයහිමි ශේෂයන්ද ඇතුලත්ව තිබුණි.	මෙම ණයගැති ශේෂය පියවීමේදී එම කාර්යයට අදාළ ලැබිය යුතු ණයගැති ශේෂය ලද පසුව ණයහිමි ශේෂය පියවීමට කටයුතු කිරීම සමාගමේ සාම්ප්‍රදායික ප්‍රතිපත්තිය වේ.	ණයහිමියන් හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. සෘණ ශේෂ හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා ආයතන සංග්‍රහය VII පරිච්ඡේදයේ 5 වගන්තිය	මෙම විධිවිධාන වලට පටහැනිව 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ නිලධාරීන් 04 දෙනෙකුට වැටුප් වශයෙන් රු. 1,519,236 ක් වැඩිපුර ගෙවා තිබුණි.	මෙම විගණන විමසුමට අදාළ ඉදිරිපත් කරන ලද කරුණු නිවැ‹ බව පිළිගනිමි. මෙම කරුණු පිළිබඳ 2024 ජනවාරි 23 දින පැවත අධ්‍යක මණ්ඩලය වෙත ප්‍රතිකා අං 2024/01-05 මගින් ඉදිරිපත් ක අතර එහි තීරණය වූයේ මෙම වැටු සංශෝධනයන් ඒ ඒ කා පරිච්ඡේදවලදී පැවති අධ්‍යක මණ්ඩල අනුමැතියට යටත්ව සිදුක ඇති බැවින් එය වෙනස් කිරීම නොකරන ලෙසයි.	චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය

(ආ)1978 දෙසැම්බර් 10 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ 842 හා 1998 අගෝස්තු 04 දිනැති අංක 359 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2)දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය	ස්ථාවර වත්කම් සම්බන්ධ අභ්‍යන්තර පාලනයේ ශක්තිමත්භාවය තහවුරු වන පරිදි ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර ක්‍රමවත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය පරිගණක පද්ධතිය ඔස්සේ පවත්වාගෙන යනු ලබයි.	ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතුයි.

1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගිණුම් විවෘත කිරිම හා ඒවාට තොරතුරු ඇතුලත් කිරීම ගිණුම් අංශයේ නිසි අධිකාරිය සහිත නිලධාරීන් විසින් සිදු කල යුතු වුවද,එවැනි විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරිමෙන් තොරව විවිධ අංශ වල විවිධ පුද්ගලයින් විසින් ඔවුන්ට අවශ්‍ය පරිදි ගිණුම්කරණ පද්ධතිය තුල විවිධ ගිණුම් විවෘත කිරීමත්,ඒවාට විවිධ තොරතුරු ඇතුලත් කිරීමත් හේතුවෙන් ගිණුම්කරණ පද්ධතිය ක්‍රමවත්ව හා විධිමත්ව පවත්වා ගැනිම අවදානමට ලක් වී තිබුණු අතර ගිණුම් වල දැක්වෙන තොරතුරු වල නිවැරදිභාවය පිළිබඳ සෑහීමකට පත්විමේ හැකියාව අවම වී තිබුණි.තවද පරිගණක පද්ධතිය වෙත ප්‍රවේශ වී ගිණුම් තැබීම මූල්‍ය අංශයට පමණක් සීමා විය යුතු වුවත් වෙනත් අංශයන්හි නිලධාරීන් 07 ක් වෙත මුරපද ලබා දී ගණුදෙනු සටහන් කිරීමට ඉඩ ලබා දී තිබුණු අතර ඒ අනුව පද්ධතියෙහි තොරතුරු වල නිවැරදිභාවය ඉහල අවදානම් මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	ඔබගේ නිරීක්ෂණ මත පදනම්ව දැනටමත් එම වරද නිවැරදි කිරීම සිදුකරන ලදි. ගිණුම් ආරම්භ කිරීම, තොරතුරු ඇතුළත් කිරීම, ගිණුම් අංශයේ නිසි අධිකාරී සහිත නිලධාරින් විසින් සිදුකරනු ලබයි.	නිසි අධිකාරිය සහිත තොරතුරු තාක්ෂණ පොදු පාලන ත්‍රම හඳුන්වා දිය යුතුය. ගිණුම්කරණ පද්ධතිය ක්‍රමවත්ව හා විධිමත්ව පවත්වා ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

2022 වර්ෂයේ අලාභය රු.14,695,458 ක් වු අතර ඊට අනුරූපීව 2023 වර්ෂයේ සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2023 සැප්තැම්බර් 30 කාලපරිච්ඡේදයේ අලාභය රු.18,647,695ක් හා සැලසිනේ මීඩියා සොලූෂන්ස් පුද්ගලික සමාගමේ සමාලෝචිත මාස 03 ක කාලපරිච්ඡේදයේ අලාභය රු. 4,828,750ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගම විසින් නිෂ්පාදක තනතුරෙහි නිලධාරියකු සේවා නියුක්ත කර නොතිබීම හේතුවෙන් නිෂ්පාදන කාර්යයන් වෙනුවෙන් එම අංශයේ කාර්යමණ්ඩලය මෙහෙයවීමට නොහැකිවී තිබුණි. 2023 වර්ෂය තුළ ආයතනයේ නිෂ්පාදන අංශයෙන් නිෂ්පාදනයන් 02 ක් පමණක් සිදු කර තිබුණු අතර එ සඳහා නිෂ්පාදන වියදම ලෙස රු.2,319,427 ක් සමාගම විසින් දරා තිබුණි. එසේම නිෂ්පාදන කටයුතු 22 ක් බාහිර ආයතන ඔස්සේ සිදුකරවාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් වියදම් ලෙස රු. 11,396,913ක් බාහිර ආයතන වෙත ගෙවා තිබුණි. මෙම නිෂ්පාදන කටයුතු 22 න් මුළු වටිනාකම රු.2,995,000 ක් එකම ආයතනයකට ලබාදුන් අවස්ථා 07 ක් නිරීක්ෂණය විය.	අප සමාගම විසින් අවම මිල ඇස්තමේන්තු යටතේ සිදු කළ හැකි හා වැඩි ලාභයක් මත කළ හැකි කාර්යයන් පමණක් සමාගම සතු මානව හා භෞතික සම්පත භාවිතා කරමින් සිදුකරනු ලබයි. ආයතනය මගින් සිදුකරනු ලබන නිශ්පාදන කාර්යයන් සඳහා කළමනාකරු (නිෂ්පාදන) විසින් මෙහෙයවීම සිදුකරනු ලබයි. එමෙන්ම සමාගමේ මිල ඇස්තමේන්තුව ඉහළ අගයක් ලබාදෙනු ලබන කාර්යයන් සඳහා සමාගමේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ඇස්තමේන්තු ලබාගෙන අඩු මිල ගණන් යටතේ කළ හැකි කාර්යයන් බාහිර සැපයුම්කරුවන් මගින් ඉටු කරවාගෙන ඇත. නිෂ්පාදක තනතුරේ සිටි සේවකයාගේ රාජකාරීන් සේවාදායකයන්ගේ අපේක්ෂාවට අනුකූල නොවීම හේතුවෙන් ඇතැම් අවස්ථාවන්හිදී බාහිර පාර්ශවයන්ගේ සේවය ලබාගැනීමට සිදුවිය.	නිෂ්පාදන කටයුතු සමාගම මගින් සිදුකිරීමට හැකිවන පරිදි විධිමත් වැඩපිළිවෙලක් කළමනාකාරීත්වය විසින් ස්ථාපිත කළ යුතු ය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පසුගිය වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිපල පිළිබඳව සැලකීමේ දී සමාගම 2019 වර්ෂයේදී රු. 8,300,209 ක ලාභයක් ලබා තිබුණු අතර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.29,339,593 ක අලාභයක් විය. 2021 වර්ෂයේ බදු පසු අලාභය රු.6,841,002 ක් වූ අතර 2020 වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.22,498,591 ක වර්ධනයක් නිරීක්ෂණය විය. තවද 2022 වර්ෂයේ අලාභය රු.14,695,458 ක් වූ අතර 2023 වර්ෂයේ සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2023 සැප්තැම්බර් 30 කාලපරිච්ඡේදයේ අලාභය රු.18,647,695ක් වූ අතර සැලසිනේ මීඩියා සොලූෂන්ස් පුද්ගලික සමාගමේ සමාලෝචිත මාස 3 ක කාලපරිච්ඡේදයේ අලාභය 4,828,750ක් විය.	පිළිතුරු ඉදිරිපත්කර නොමැත.	මූල්‍ය තත්ත්වයේ පිරිහීම වලක්වා ගැනීමට කළමණාකරණයේ අවධානය යොමු කළ යුතුය. ආදායම් ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමේ නිෂ්පාදන අංශය සතු දේපළ, පිරියත හා උපකරණ බොහෝ කලක් නිශ්ක්‍රීයව පැවතුණු බව නිරීක්ෂණය වූ අතර සංස්කරණයන් සිදුකිරීමට යොදාගනු ලබන පරිගණක නිරන්තරයෙන් ක්‍රියාවිරහිතව පැවතීම හේතුවෙන් ඒවායෙන් කිහිපයක් ක්‍රියාත්මක නොවන තත්වයට පත්ව තිබුණි. ක්‍රියාත්මකව පවතින පරිගණක වල ද ස්ථාපනය කර තිබුණු ප්‍රතිවෛරස් මෘදුකාංග(Virus Guard) යාවත්කාලීන කර නොතිබුණි.	2024 වර්ෂය ආරම්භයේදී පරිගණකවල පැවති ප්‍රති වෛරස් මෘදුකාංගය යාවත්කාලීන කිරීමට පියවර ගන්නා ලදි.	ආයතනය සතු සම්පත් වල යහපැවැත්ම හා ආරක්ෂාව තහවුරු කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ආයතනයෙහි කලා අධ්‍යක්ෂක තනතුර දරන නිලධාරියා ග්‍රැෆික් අංශයේ සෝදුපත් පරීක්ෂණ කාර්යයේ පූර්ණකාලීනව සේවා නියුක්ත කොට තිබුණු අතර කලා අධ්‍යක්ෂ වරයෙකුගෙන් නිෂ්පාදන අංශය වෙත සපයා ගතහැකිව තිබූ කාර්යභාරය ඉටුකරවා ගැනීමට කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි.	ඔහු කලා අධ්‍යක්ෂ වශයෙන් තනතුරට බඳවා ගත් 2019 නොවැම්බර් 18 දින සිට සෝදුපත් පරීක්ෂා කටයුතු සඳහා යොදවා ඇත.	මානව සම්පත විධිමත් අන්දමින් උපයෝජනය කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2022- 2026 සංයුක්ත සැලැස්ම අනුව 2023 වර්ෂයේ දී රු.903,000,000 ක ආදායමක් ඉලක්ක කලද උපයා තිබුණු ආදායම රු. 233,328,718 ක් වූ අතර ඉලක්ක සපුරා තිබුණේ සියයට 26 ක ප්‍රතිශතයකිනි.එමෙන්ම 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ විකුණුම් ආදායම සියයට 28 ක ප්‍රතිශතයකින් එනම් රු.89,765,607 ක වටිනාකමකින් අඩු වී තිබුණි. 2022 සහ 2023 වර්ෂයන්හි විකුණුම් ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සැලසිනේ සමාගම විසින් ස්ථාපිත කරන ලද උපායමාර්ග කිසිවක් එම කාලපරිච්ඡේදයන් හිදී සපුරාගෙන නොතිබුණි. එමෙන්ම සැලැසුම් සහ සත්‍ය ප්‍රතිඵල අතර විචල්‍යතාවයන් හඳුනාගැනීමට හා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023 වර්ෂයේ රට තුළ පැවති අයහපත් මූල්‍ය අර්බුධය හේතුවෙන් ව්‍යාපාරික අවස්ථා සැලසීනෝ ආයතනය වෙත නොලැබීම නිසා අලෙවි ආදායම් විශාල අඩුවීමක් සිදුවිය. එබැවින් ස්ථාපිත කරනු ලැබූ ඉලක්ක කරා ලඟාවීමට නොහැකි වීම මත සැලසුම් කරන ලද ඉලක්ක හා සත්‍ය විකුණුම් ඉලක්ක අතර විචලතා පැවතුණි. 2024 වර්ෂයේදී ආයතනයේ කළමනාකරණය විසින් සැලසුම්ගත ඉලක්ක වෙත යොමුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරයි.	සැලසුම් තාත්වික වියයුතු අතර විචලතාවයන් හඳුනාගැනීමත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමත් කටයුතු කළ යුතුය.

(ආ)සංයුක්ත සැලස්මට අනුගතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්ම තුල 2023 වර්ෂයේ දී පෞද්ගලික අංශයේ සේවාදායකයින් සැලසිනේ සමාගම සමඟ සම්බන්ධ කර ගැනීම සඳහා ඉලක්ක ස්ථාපිත කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂයේදී එම ඉලක්ක සපුරා ගෙන නොතිබුණි.	2023 වර්ෂයේදී අපේක්ෂා කළ පරිදි නව සේවාදායකයින් ආකර්ෂණ කිරීමේ හැකියාවක් නොපැවතුණි. 2024 වර්ෂයේදී ව්‍යාපාරික අවස්ථා සොයාගැනීම හා නව සේවාදායකයින් පිළිබඳ අවධානය යොමු කිරීම ආදී ක්‍රියාමාර්ග කෙරෙහි යොමුවිය.	ඉලක්ක ළඟාකර ගැනීම සඳහා උපායමාර්ග ස්ථාපිත කළ යුතුයි.
(ඇ) 2023 වසර අවසන් වන විට නිෂ්පාදන අංශයේ කාර්යමණ්ඩලයේ වෙනත් වෘත්තීය නිපුණතා භාවිතා කරමින් සමාගමේ ඵලදායීතාවය වැඩිකර ගැනීමට 2022 වර්ෂයේ සැලසුම් කර තිබුණද 2023 වර්ෂයේ අවසානය වන විට නිෂ්පාදන අංශයේ කාර්ය මණ්ඩලය ඌණ උපයෝජිතව සමාගම තුළ සිටීම සහ සංස්කරණ මැදිරි ඌන උපයෝජිත තත්වයක පවතින බව ස්ථානීය පරික්ෂාවේ දී විගණනයට නිරීක්ෂණය වු අතර 2022 වර්ෂය තුළ අපේක්ෂිත සැලසුම් සඳහා සංවිධානය වීම,සේවකයින් මෙහෙයවීම හා පාලනය යන කළමනාකරණ ක්‍රියාවලියේ අදියරයන් කාර්යක්ෂමව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි .	සංස්කරණ මැදිරි 02 හි කිසිඳු කාර්යයක් නොවූ කාලය තුළ නිකරුනේ පරිගණක ක්‍රියාත්මක කර අනෙකුත් විදුලි උපකරණ නිකරුනේ ක්‍රියාත්මක වීම හේතුවෙන් ආයතනයට දැරීමට අසීරු විදුලි බිල්පත් ගෙවීමට සිදුවීම නිසා කාර්යයක් නොමැති අවස්ථාවන්හිදී විදුලි උපකරණ ක්‍රියාත්මක නොකර තැබීමට නිලධාරීන්ට වාචික උපදෙස් ලබාදී තිබුණු අතර කිසිඳු අවස්ථාවක සම්පූර්ණ වසා තැබීමට නියෝග කර තිබුණේ නැත. මීට අමතරව එම සංස්කරණ මිදිරිවල නිලධාරීන් පෞද්ගලික ව්‍යාපාරික කටයුතු සිදුකරනු ලබන බවට නිෂ්පාදන අංශයේ නිලධාරීන් හරහාම ලැබී ඇති තොරතුරු හේතුවෙන් එම තත්ත්වය පාලනය සඳහා එම අංශයන්හි සිදුවන එදිනෙදා රාජකාරීන් පිළිබඳ දැනුවත් වීමට දෛනික කාර්යසටහන් යෙදීමට කටයුතු කරන ලදි. ඒ සඳහා Job Card ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලදි.	සම්පත් නිසි අන්දමින් උපයෝජනය කළ යුතුය.
(ඈ)බාහිර ආයතනයන් හරහා නිෂ්පාදන සිදු කරවා ගැනීමෙන් තොරව සමාගම තුළ වැඩසටහන් නිෂ්පාදනය කරමින් ආයතනයේ විකුණුම් සඳහා ඉහල දායකත්වයක් ලබාදීමට උපාය මාර්ග 06ක් සංයුක්ත සැලස්ම තුල ඇතුලත් කර තිබුණද ඒවා ළඟා කර ගැනීමට 2023 වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.	මේ පිළිබඳ සවිස්තරාත්මකව සොයාබලා අදාළ නිවැරදිකිරීම් කිරීමට කටයුතු කරමි.	සැලසුම්කළ ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතුකළ යුතුය.
(ඉ)2022 වර්ෂය තුළ නිෂ්පාදන අංශයේ සැලසුම් කර ඇති ප්‍රසම්පාදනයන්ට අදාල තොරතුරු එනම් ප්‍රසම්පාදන විස්තරය ,ඇස්තමේන්තු ගත වියදම,අරමුදල් සම්පාදන මූලාශ්‍ර පිළිබඳව ප්‍රසම්පාදන සැලැස්ම තුළ නිශ්චිතව දක්වා නොතිබුණි.	මේ පිළිබඳ සවිස්තරාත්මකව සොයාබලා අදාළ නිවැරදිකිරීම් කිරීමට කටයුතු කරමි.	ප්‍රසම්පාදනයන්ට අදාළ තොරතුරු ඇතුළත් කරමින් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කළ යුතුය.

(ඊ) 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි 2012 වර්ෂයේ සිට එකතුකර ගැනීමට ඇති ණය මුදල් අයකර ගැනීම සඳහා ඉලක්ක ගත වැඩපිළිවෙලක් 2022 -2026 සංයුක්ත සැලැස්ම මගින් ස්ථාපිත කර තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට පැවති වසර 2014 -2021 කාලසීමාවක සිට අයවිය යුතු රු.මිලියනය ඉක්මවූ ණය ගැති ශේෂ 21 ක එකතු වටිනාකම රු.172,420,860 ක් 2023 දෙසැම්බර් 31 වන විටත් අයකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.	ණය අයකර ගැනීම වෙනුවෙන් කමිටුවක් පත්කර ඇති අතර ණය අයකර ගැනීමේ නිලධාරීන් විසින් වර්ෂ කීපයක සිට පැවත එන ණය අයකර ගැනීමට කටයුතු කරගෙන යන බව ප්‍රකාශ කරමි.	ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2022- 2026 සංයුක්ත සැලැස්ම අනුව 2022 වාර්ෂික විකුණුම් රු.බිලියනයක වටිනාකමක් සහ 2023 වර්ෂයේ රු.මිලියන 903 ක් ඒ ඒ වර්ෂ වලදී ඉලක්ක වශයෙන් සඳහන් කර තිබුණද 2022 සහ 2023 වර්ෂවල ක්‍රියාකාරී සැලැස්ම අනුව වාර්ෂික විකුණුම් ඉලක්ක ලෙස පිළිවෙලින් රු.මිලියන 860 ක් සහ රු.මිලියන 587 ක වටිනාකමක් සඳහන් කර තිබුණි. ඒ අනුව සමාගමේ සංයුක්ත සැලස්මට අනුගතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2021 වර්ෂය අවසානයේ සකස් කරනු ලැබූ පස් අවුරුදු සංයුක්ත සැලැස්ම සකස් කිරීමේදී අපේක්ෂා කරනු ලැබුවේ වාර්ෂිකව සියයට 5 බැගින් විකුණුම් ඉලක්ක ඉහළ දැමීම වේ. වාර්ෂික සකස් කරනු ලබන ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී පෙර වර්ෂයේ විකුණුම් ඉලක්ක පාදක කර ගනිමින් සකසා ඇත. ක්‍රියාකාරී සැලැස්ම හා සංයුක්ත සැලැස්ම සංශෝධනයට ලක් කළ යුතුවේ.	සංයුක්ත සැලස්මට අනුගතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය.

4.3 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය හා 2(1) වන උප වගන්තිය විධිවිධාන ප්‍රකාරව සමාගමේ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර ගැනීම සඳහා මෙම වාර්තාවේ දින දක්වා කටයුතු කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණකවරයකු මෙම විගණන වාර්තාවේ දිනය දක්වා පත්කර නොතිබුණි.	අභ්‍යන්තර විගණකවරයෙකු අනුමත කරගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.	පනතේ විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගත යුතුය.